කටාන ප්‍රාදේශීය සභාව
----------------------------
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දිමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | උසාවි දඩ මුදල හා මුද්දර ආදායම්වලින් ගෙවීම් කිරීමේ පදනමින් කම්පැක්ටරයක් හා ට්‍රැක්ටර් රථ 02 ක් මිලදී ගැනිම් ගිණුම් ගත කිරීමේදි ණයගැති ගිණුම රු.2,014,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | වියදම් ණයහිමි ශේෂය තුළ රු.8,278,500 ක් වටිනා ගබඩා ණයහිමි ශේෂයක් පැවතිම හේතුවෙන් ණයහිමියන් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2018 දෙසැම්බර් මාසයට අදාලව ලද ස්ථාවර තැන්පත් පොලී රු.115,068 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | වර්ෂයට අදාල මුදල පමණක් ගිණුම් ගත කළ යුතුවේ. | වර්ෂයේ අතිරික්තය සමුච්චිත අරමුදලට ගැලපීම නිසා එහි වටිනාකම එම අගයෙන් සමුච්චිත අරමුදලට බැර වී ඇති නිසා නැවත නිවැරදි කිරීමක් කළ නොහැකි බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාරික වශයෙන් ගෙවීම සඳහා ණය පදනම මත ලබාගෙන තිබූ හා 2019 දෙසැම්බර් 31 දිනට ගෙවා අවසන් නොකළ රු.4,517,937 ක කම්පැක්ටර් හා ටේලර් රථ වටිනාකමක් ප්‍රාග්ධනිත කර තිබුණි. | ගෙවූ වාරික පමණක් ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | පරිත්‍යාග වශයෙන් ලද රු.6,221,373 ක් වූ කම්පැක්ටර් රථය සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් වශයෙන් ගිණුම්ගත කර එය ගබඩාවෙන් ඉවත් කිරීමේදි සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ ගබඩාවෙන් නිකුත් කරන ලද රු.30,327 ක් වටිනා ගබඩා ද්‍රව්‍ය දෙවරක් ගිණුම්ගත වීම නිවැරදි කිරිම සඳහා සමුච්චිත අරමුදල බැර කර තිබුණි. | වටිනාකම් ද්වි ගණනය නොවිය යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (උ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලින් ඉදිවන කටාන උප කාර්යාලීය ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා අවසන් කරන ලද රු.23,697,498 ක වටිනාකමක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගෙවා අවසන් කළ ඉදි කිරීම් වටිනාකම ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඌ) | 2004 වර්ෂයේදී ප්‍රාදේශිය සභාව වෙත පවරා දී තිබු ට්‍රැක්ටර් රථයේ පිරිවැය තක්සේරු කොට ප්‍රාග්ධනිත කොට නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (එ) | භෞතික තොග ශේෂය ගිණුම්වලට ගැලපීම් නොකර, රු. 12,501,427 ක තොග ලෙජර ශේෂය ගිණුම්ගත කර තිබුණි. | අවශය ගැලපීම් කර භෞතික තොග ශේෂය ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඒ) | පළාත් 2019 සැප්තැම්බර් 21 දිනැති ලිපිය අනුව ඉකුත් වර්ෂ සඳහා ලැබිය යුතු හිඟ වැටුප් හා සභික දීමනා ලැබිය යුතු ලෙස ගිණුම්වලින් නොපෙන්වන ලෙස දන්වා තිබියදි ලැබිය යුතු හිඟ වැටුප් හා සභික දීමනා ලෙස පිළිවෙලින් රු.58,904,638 ක් හා රු.1,897,525 ක් ගිණුම්වල පෙන්වා තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුවේ. | ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාගෙන නැවත මෙම ගිණුම නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඔ) | ,ළාත් පාලන කොමසාරිස්ගේ 2019 සැප්තැම්බර් 21 දිනැති ලිපිය අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා ලැබිය යුතු දේපල ණය පොලී ලැබිය යුතු ලෙස ගිණුම්වලින් නොපෙන්වන ලෙස | නිවැරදිව මූලා ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාගෙන නැවත මෙම ගිණුම නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | දන්වා තිබියදී සමාලෝචිත වර්ෂය සඳහා රු.496,248 ක් හා ඉකුත් වර්ෂ සඳහා රු.240,319 ක් ගිණුම්වල පෙන්වා තිබුණි. | | |
| (ඕ) | පරිත්‍යාග ලෙස ලද වටිනාකම රු.43,320,500 ක් වූ උදම්මිට නව ආදාහනාගාරය හා වටිනාකම ගණනය නොකල විදුලි ජනක යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පරිත්‍යාග ලෙස ලද වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.2 නොසැසඳුනු ගිණුම්
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 06 ක ගිණුම් අනුව ශේෂයන් හා එදිනට උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.97,775,073 ක වෙනස්කම් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.3 ලැබිය යුතු ගිණුම්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 15 කට ඉහතදී කර්මාන්ත 08 ක් වෙනුවෙන් ලබාදී තිබූ රු.139,615 ක් වූ පෙර ගෙවුම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
--------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.40,375,618 ක් වූ ගිණුම් ශේෂයකට අදාල උපලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | මේ වන විට මෙම ගිණුම නිරවුල් කරමින් පවතින බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

-----------------

1.4.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය | කට්ටි කළ ඉඩම් විකිණීමෙන් ලද මුදලින් සියයට 01 ක් අය කළ යුතු වුවද 2018 හා 2019 වර්ෂයන්හි මුල් මාස 06 හි ඉඩම් කට්ටිකර විකිණීම මත අයකර තිබූ සියයට 01 ක මුදල, සත්‍ය විකුණුම් වටිනාකම මත අය කර නොතිබුණි. | පනතේ විධි විධාන අනුව කටයුතු කිරීමට කළමනාකරණ යේ අවධානය යොමු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) | සමාලෝචිත වර්ෂය තුළදී ලබාදී තිබූ රු.1,028,360 ක් වූ පෙර ගෙවුම් වටිනාකමක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට කළමනාකරණ යේ අවධානය යොමු කළ යුතුවේ. | පෙර ගෙවුම් වටිනාකම ඉදිරියේදී පියවීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2018 ජුලි 19 දිනැති අංක 2018/e-Local Government-01 දරන බස්නාහිර පලාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | අන්තර් ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් සිදු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණි | පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට කළමනාකරණ යේ අවධානය යොමු කළ යුතුවේ. | මේ වන විට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතින අතර එකී ක්‍රියාවලිය අවසන් කොට ප්‍රගතිය වාර්තා කරන බව කාරුණිකව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 170,504,415 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 70,277,529 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 36,425 | 44,107 | 44,991 | 27,343 | 36,100 | 46,838 | 46,990 | 28,392 |
| (ii) | කුලී | 734 | 1,772 | 1,773 | 20 | 1,155 | 923 | 932 | 29 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,862 | 1,186 | 1,186 | - | 1,530 | 1,266 | 1,948 | - |
| (iv) | වෙනත් ආදායම් | 125,278 | 125,278 | 125,278 | - | 155,220 | 155,220 | 98,088 | - |
| | | 165,299 | 172,343 | 173,228 | 27,363 | 194,005 | 204,247 | 147,958 | 28,421 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට රු.28,536,787 ක් වූ වරිපනම් හිඟයෙන් සමාලෝචිත වර්ෂයේ රු.11,371,221ක් අයකර තිබූ අතර තවදුරටත් අය කළ යුතු මුදල රු.17,165,566 ක් විය. | හිඟ ශේෂය අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ආදායම් අයකිරීමේ ප්‍රතිශතය වැඩි කර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අක්කරපනහ, සම්පත් පෙදෙස පිහිටි පර්චස් 17.5 ක ඉඩම් කොටසක් පොදු පහසුකම් සඳහා සභාවට පැවරී වර්ෂ 25 ක් ගතව තිබුණද ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම නිසා එම ඉඩමේ දැවයෙන් හා බ්ලොක් ගලින් නිමවූ කුඩා ප්‍රමාණයේ නිවාස 02 ක් අනවසරයෙන් ඉදිකර භාවිතා කරමින් පැවතුණි. | සභාව සතු දේපල ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සන්තකය පවරා ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මිරිස්වත්තේ පිහිටි සබීඩියාවත්ත ඉඩම සඳහා 2019 ජූලි 19 දින අනුබෙදුමක් අනුමත කර, පර්චසයක් රු.95,000 සිට 125,000 දක්වා අඩු විකුණුම් වටිනාකම් මත අයකර තිබූ සියයට 01 ක විකුණුම් බදු මුදල රු.499,792 ක් විය. | සත්‍ය විකුණුම් වටිනාකම මත අය කළ යුතුවේ. | පිළිගන්නා බව දන්වමි. |
| (ඇ) | රද්දොළුව උප කාර්යාල බල ප්‍රදේශයේ බේල් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීමේදී එහි වහලට යකඩ බාර් යෙදීම සඳහා රු.328,000 ක් ඇස්තමේන්තු කර 2019 සැප්තැම්බර් 12 දින රු.327,000 ක් ගෙවීම් කර තිබුණි.එහෙත් වහලය සෙවිලි කිරීම සඳහා ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් එම යකඩ බාර් වැස්සට තෙමී දිරාපත් වෙමින් පැවතුණි. | සියළු කටයුතු අවසන් කිරීමට හැකිවන අයුරින් ව්‍යාපෘති සැලසුම් කළ යුතුවේ. | ගොඩනැගිල්ලේ ඉතිරි නිමාවන් ඉතා කඩිනමින් නිමකර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිවාස සංවර්ධන අධිකාරිය විසින් පැවරීම් කර තිබූ රද්දොළුගම නිවාස සංකීර්ණය පරිශ්‍රයේ පිහිටි මස් කඩ 04 ක් ටෙන්ඩර් කිරීමකින් තොරව බදුකරුවන්ගේ ඉල්ලීම මත බදුදී තිබූ අතර ටෙන්ඩර් නොකිරිම නිසා සභාවට හිමිවිය යුතු ආදායම් අහිමිවී තිබුණි. | බදු දීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියා මාර්ගය අනුගමනය කළ යුතුවේ. | 2019 වර්ෂයට වාර්ෂික ටෙන්ඩර් කැඳවීම මඟින් බදු ගෙන නැති අතර ඉල්ලීම මත බදුගෙන ඇති බව දන්වමි. |
| (ආ) | කොන්දගම්මුල්ල ප්‍රදේශයේ පිහිටි පර්චස් 40 ක බිම් ප්‍රමාණයක් ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීමේ ව්‍යාපාරයක් පැවැත්වීම සඳහා ව්‍යාපාරිකයෙකුගේ ඉල්ලීම මත රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව බදු දී තිබූ අතර මාසික බදු කුලිය රු.2,000 ක් ලෙස ගිවිසුම් ගත වී තිබුණි. ඒ සඳහා උපයෝගි කර ගත් පදනම අනාවරණය නොවූ අතර බදු කාල සීමාව, 2019 නොවැම්බර් 15 දින සිට 2020 නොවැම්බර් 14 දක්වා තවත් වර්ෂයකින් දීර්ඝ කර තිබුණි. | බදු දීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරුව ලද විගස 2019 නොවැම්බර් මස සිට සංශෝධිත බදු කුලිය අයකිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

3.3 වත්කම් කළමණාකරණය

-----------------------------

3.3.1 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ------------------------------------------ |
| (අ) 2004 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ට්‍රැක්ටරය සඳහා ආදායම් බලපත්‍රයක් ලබා නොගැනිම හේතුවෙන් ධාවනයේ යොදවා නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා මේ වනවිට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර එය ලබා ගැනීමෙන් අනතුරුව ධාවනය සඳහා යෙදවීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) වටිනාකම රු.525,000 ක් වූ ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බොබ් කැට් යන්ත්‍ර 03 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ක්‍රියාත්මක තත්ත්වයට පත් කළ නොහැකි නම් අපහරණය කළ යුතුවේ. | අපහරණ කටයුතු සිදු කිරීමෙන් අනතුරුව ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි |